# ඇමැතිවරුන් අසරණයි මිල තීරණය කරගන්නවත් බැහැ

### ලංවිම ඉංජිනේරු සංගමයේ සභාපති අතුල වන්නිආරච්චි

ආසියාවේ මෑතකාලීනව දියුණු වූ හැම රටක්ම දියුණු වුණේ දේශපාලකයන්ගේ අවංකභාවය මත මිසක් ප්‍රතිව්‍යුහගතකරණයක් නිසා නෙවෙයි. **හොඳම උදාහරණය තමයි ලංවිම ප්‍රතිව්‍යුහගතකරණය කියලා හදපු මහජන උපයෝගිතා කොමිසම.** දැන් ඇමැතිවරු දෙන්නත් අසරණයි. මිල තීරණය කරන්නවත් බලාගාර හදන්නවත් තීන්දු ගැනීමේදී ඔවුන්ට බලයක් නෑ.

විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යංශය යනු මෑත කාලයේ දැඩි ආන්දෝලනයට තුඩු දුන් සිදුවීම් දාමයකට පාර කැපූ තැනකි. මේ අතර විදුලිබල මණ්ඩලයත් එය නියාමනයට පිහිටුවා ඇති මහජන උපයෝගිතා කොමිසමත් අතර සීතල යුද්ධයක් හටගෙන ඇත. මේ උද්ගතව ඇති තත්ත්වය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු සංගම් සභාපති අතුල වන්නිආරච්චි මහතා බෙහෙවින් සංවේදීය.

**විදුලිබලය සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය දැන් තිබෙන්නේ කවර තැනකද?**

මීට මාස හතරකට වගේ කලින් අගමැතිවරයාගේ පාර්ශ්වයෙන් ආපු අදහස වුණේ දුප්පත් රටක් හැටියට ඕනෑ නම් තවත් ගල් අඟුරු බලාගාර දෙකක් පමණක් හදමු යන යෝජනාවයි. එහෙම කතා කරලා සාම්පූර් හදන්න ටෙන්ඩර් දැන්වීමට දින දෙකකට කලින් ඒකත් හදන්න එපා කියලා ආණ්ඩුවෙන් පණිවිඩය ආවා. රාජ්‍ය ප්‍රතිපත්ති මාසෙන් මාසෙට වෙනස්වෙන තත්ත්වයක් තිබෙන්නේ. අපට දරාගන්නම බැරි එයයි.

**සාම්පූර් බලාගාරය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නෑ කියලද ඔබ කියන්නේ?**

සාම්පූර් සම්බන්ධයෙන් අපටත් ප්‍රශ්න තිබෙනවා. හැබැයි දැන් මේ රජය තල්ලු වී තිබෙන්නේ ඩීසල් බලාගාර කියන ඒ වාගේ දහ ගුණයක් පාඩු විසඳුමකටයි. මේ අතිරේක වැය දරන්න වෙන්නේත් විදුලි පාරිභෝගිකයටයි. තව අවුරුදු පහක් යද්දී මේ නිසා විදුලි බිල දෙගුණයකින් පමණ වැඩිවීමේ අවදානමක් තිබෙනවා.

## මහජන උපයෝගීතා කොමිසමේ බෝඩ් එක බුදුසරණයි වුණාට ඇතුළෙ හොර හරක්

**විදුලිබිල දෙගුණයකින් පමණ වැඩිවීමක් කියන්නේ බරපතළ තත්ත්වයක්. ඒක මුළු සමාජයටම බලපෑමක් නොකරාවිද?**

ඔව්. ඊටපස්සේ කර්මාන්තවලත් විදුලි බිල වැඩිවෙනවා. විදුලි බිල අධික වීමෙන් බැට කන ඇඟලුම් කම්හල් එකින් එක දැනටමත් වැහීගෙන යනවා. අපේ මිනිස්සු දැන් බංග්ලාදේශෙට යන්නෙ. විශාල ප්‍රතිශතයකින් කම්හල් වැසීයාමක් සිදුවුවහොත් කොල්ලන්ට කෙල්ලන්ට රස්සා නැතිවෙන්න පුළුවන්. එහි ප්‍රතිඵලය වෙන්නේ තරුණ අසහනයයි. මේ විදියටම ගියොත් තව අවුරුදු දහයක් පහළොවක් යද්දි ආපහු තරුණ කැරලි ඇතිවෙන්නත් බැරි නෑ.

**විදුලිබල අර්බුදයේදී විෂය බාර ඇමැතිවරුන්ගේ මැදිහත්වීම හා දැනුම්වත් බව ප්‍රමාණවත් ද?**

අපට ඇමැතිවරු දෙන්නෙක් ඉන්නවා. මේ තීන්දු ගැනෙන්නේ ඔවුන් දැනුම්වත්වදැයි අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. මෙවැනි දේ පාර්ලිමේන්තුවේ දියුණු වාද විවාදවලට ලක්ව තීන්දු ගත යුතුයි.

**අලුතින් විවර වූ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩ රාජ්‍ය නිලධාරීන් වැරදි ලෙස පාවිච්චි කරන බවට ආණ්ඩුවෙන් චෝදනා එල්ලවෙනවා. ඔබලා ඉස්සරත් මේ විදියටම හඬ නැගුවා නම් නොරොච්චෝලෙ නතර කරගන්න බැරිවුණේ ඇයි?**

ඒක වැරදි කතාවක්. අපි ආණ්ඩු සමග රණ්ඩු වෙන පිරිසක් නෙවෙයි. අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය නිර්දේශපාලනිකයි. අද කියලා විශේෂයක් නෑ. යුද්ධය අවසාන කාලයේදී කිසිදු රටකින් ආධාර නොකරන පසුබිමක චීනයෙන් හරි මේක හදාගත්තාට කමක් නෑ කියලයි අපි නිහඬ වුණේ. නොරොච්චෝලෙ නැවැත්වීමට අපේ උත්සාහයක් තිබුණේ නෑ. අපි බැලුවේ ජපානය යටතේ උසස් තාක්ෂණයෙන් එය ඉදිකරගන්නයි. ඒ අවස්ථාව නැතිකළේ අදූරදර්ශී නායකයන්. අනෙක් අතට නොරොච්චෝලෙ ප්‍රශ්න තිබුණත් මුළුමනින්ම අසාර්ථක ව්‍යාපෘතියක් යැයි කීම වැරදියි. රටේ ආර්ථිකය මේ මට්ටමින් හෝ තිබෙන්නේ නොරොච්චෝලෙ නිසයි.

**ඒක මහ හතරබීරි කතාවක්නෙ. එක පැත්තකින් බණිනවා. අනෙක් පැත්තෙන් සුදු හුණු ගානවා?**

නැහැ. මේක සුදුහුණු ගෑමක් නෙවෙයි. උදාහරණයකින් පැහැදිලි කළොත් නොරොච්චෝලෙ දැනට තිබෙන බලාගාරයේ විදුලි ඒකක ගණනම ඊළඟට අඩුම වියදම් වන ඩීසල් බලාගාරයෙන් හැදුවත් දවසකට රුපියල් මිලියන 250 - 300 අතර වැඩි වියදමක් දරන්න වෙනවා. මේක දවස් 365න් වැඩි කළාම එන බිලියන ගණනේ උත්තරේ බැලුවාම ඔබට එය වැටහේවි. විදුලි බිල ඩබල් විමේ අවදානම එන්නේ එතැනින්.

**විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති යනුවෙන් විෂය වෙන්වුණත් පුනර්ජනනීය බලශක්තිය සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක ද?**

පුනර්ජනනීය කියන්නේ නැවත නැවතත් පාවිච්චි කරන්න පුළුවන් කියන එකනෙ. ලංකාව කියන්නේ එක කාලයකදී 100% ක්ම පුනර්ජනනීය බලශක්තියෙන් දුවපු රටක්. දැන් ගත්තත් 40 - 50% ක් පමණ විදුලිය නිෂ්පාදනය වන්නේ පුනර්ජනනීය බලශක්තියෙන් තමයි. පුනර්ජනනීය කිව්වාම අපේ ජලවිදුලි බලාගාරත් අයිතියි. දැනට වුණත් පුනර්ජනනීය විදුලිය පාවිච්චි කරන ලෝකයේ හොඳම රටවල් 15 අතරේ අපි ඉන්නවා.

**එහෙම නම් පුනර්ජනනීය බලශක්තියට දිරිදීමක් නෑ කියන චෝදනාව ඔබ පිළිගන්නෙ නැද්ද?**

අපේ රටේ පුනර්ජනනීය බලශක්තිය කියලා වැඩිපුර කෑගහන්නේ බිස්නස්කාරයෝ. දැනට මෙගාවොට් 130ක පමණ සුළං විදුලිය ජනනය වෙන්නේ පුත්තලම පෙදෙසේ ක්‍රියාත්මක පෞද්ගලික අංශ බලාගාරයකින්. ඒ ඒකකයකට අපි රුපියල් 20ක් ගෙවනවා. මේ මිල වැඩියි. මේකට අපි රණ්ඩු වුණා. අපි කිව්වේ ලෝකයේ හොඳම සුළං විදුලිය නිපදවිය හැකි මන්නාරමේ රාජ්‍ය මැදිහත්වී අවම වියදමකින් විදුලිය නිපදවමු කියලයි. අපිට ඒක රුපියල් 10කට කරන්න පුළුවන්. මේ වෙලාවෙ පවා මෙගාවොට් 100ක් හදන්න ව්‍යාපෘතියක් කරගෙන යනවා. ඒකට රුපියල් බිලියන 20ක ණයක් ඕනෑ. දැනට වාර්ෂිකව රුපියල් බිලියන 240ක ආදායමක් අපට තිබෙනවා. ඒ මුදල් ගනුදෙනු සිදුවන මහජන බැංකුවෙත් ඒ ණය දෙන්නත් කැමැතියි. හැබැයි මුදල් අමාත්‍යංශයෙන් ඒකට ඉඩදෙන්නේ නෑ. පුනර්ජනනීය විදුලිය නඟගන්න ඕන්න අපට තිබෙන සහයෝගය. හැබැයි පෞද්ගලික අංශයට උදවු කරනවා.

**ව්‍යාපෘති පැවැරීම්වලදී ටෙන්ඩර් කැඳවීම් නොමැතිවීමත් විදුලිබල විෂයයේදී තදින් කතා කෙරුණු මාතෘකාවක් වුණා. ඒ තත්ත්වයේ වෙනසක් නැද්ද?**

තරගකාරී මිල ගණන් යටතේ ඒවා සිදුවිය යුතු බව අපි දිගින් දිගටම කිව්වා. ඒකට විරුද්ධ වුණේ පෞද්ගලික අංශයේ මාෆියාවයි. ජනාධිපතිවරයා මැදිහත්වෙලයි අන්තිමේදී විසඳුමක් ලැබුණේ. උදාහරණයකට පසුගිය සතියේ කෙරුණු එවැනි කැඳවීමකින් විදුලි ඒකකයක් නිපදවීමට රුපියල් 12.30කට අඩුම ලංසුව පැමිණ තිබුණා. දැනට ක්‍රියාත්මක ඇතැම් ව්‍යාපෘතිවලට රුපියල් 23ක් පවා ගෙවන පසුබිමක මේ වෙනස බලන්න. පුනර්ජනනීය බලශක්තිය දියුණු කරන්න බැරිව තිබෙන්නේ මේක බඩගෝස්තරයක් කරගත්ත ඇතැම් දේශපාලකයන්ට සම්බන්ධ ව්‍යාපාරිකයන් නිසයි.

## ජනතාව වෙනුවෙන් රණ්ඩු කළාම අපිට බණිනවා

**පරිසර සංවිධානවල මැදිහත්වීම සංවර්ධන ව්‍යාපෘතිවලට බාධකයක් වන මට්ටමට පැමිණ ඇතැයි රජය කිව්වත් මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතන පවා බහුජාතික සමාගම්වලට යට වී ඇතැයි පරිසරවේදීන් චෝදනා කරනවා. නිවැරැදි කවුද?**

යම්කිසි සංවර්ධන වැඩකදී අනිවාර්යෙන්ම පරිසරයට බලපෑමක් වෙනවා. නෑ කියනවා නම් ඒක බොරුවක්. හැබැයි අපි මේ දෙස බැලිය යුත්තේ තුලනාත්මකවයි. පරිසරයට හානි පමුණුවලා කරන දියුණුවෙන් පලක් නෑ. වගේම පරිසරයම ගැන විතරක් හිතලා තරුණ අසහනය ඇතිවෙන ආකාරයේ තත්ත්වයන්ට යෑමේත් පලක් නෑ. ලංකාවේ ගත්තාම පරිසර සංවිධානවල කොටස් දෙකක් සිටිනවා. එක පිරිසක් අවංකවම පරිසරයට ආදරෙයි. සමහර දේ අතිශයෝක්තියෙන් මවා පෙන්නමින් කෑගහන්නෙත් ඒ ආදරය නිසයි. තිත්තයාට හානියක් වෙනවා කියලා මරාගෙන මැරෙනවා. ඒ අව්‍යාජකමට අපි ගරුකරනවා. හැබැයි මේ කණ්ඩායමයට සැඟවී තව මුදලාලිලා කණ්ඩායමකුත් ඉන්නවා. අපි මොන බලාගාරයක් හදන්න ගියත් කෑ ගහන මේ අය පෞද්ගලික අංශයෙන් වැඩක් කරද්දී මුලදි කෑ ගැහුවත් ටික දවසකින් ප්‍රදුමාකාර විදියට නිහඬ වෙනවා.

**ඒත් ඉදිකිරීම්වලදී පරිසර නීතිවලින් රිංගා ගිය තත්ත්ව පිළිබඳ නිරන්තරයෙන් මාධ්‍ය වාර්තා පළවෙනවා. ඔබ කියන්නේ ඒවාට පදනමක් නෑ කියලද?**

ඔක හරියට ගමක ළමා අපහරණයක් වුණාම කොල්ලෝ ටික ඔක්කෝම එල්ලන්න ඕනෑ කියලා රැල්ලට නැගෙන ෂෝෂාවක්. ගෝවා ගෙඩියක අළු තිබුණා යැයි කියලා බලාගාරයක් වහන්න බෑ. මේවා ගැන ආණ්ඩු තීරණ ගන්න ඕනෑ නියුණු මහජන සංවාදයකින්. එහෙම නොකර නිතර තීන්දු වෙනස්කිරීම බරපතළ ප්‍රශ්නයක්. මෙතැන තිබෙන ප්‍රධාන කාරණයක් වන්නේ ප්‍රාමාණිකයන් හැටියට අපි කියන කරුණුවලට වඩා ආකර්ශනීය ලෙසින් පරිසර සංවිධානවල අදහස් මහජනයා වෙත සන්නිවේදනයවීමයි. නොරොච්චෝලෙ පටන්ගන්න කලින් තිබුණු රූපවාහිනී සංවාදයකදී එක් කථිකයෙක් කිව්වේ ඇසිඩ් වැහි වැටිලා ශ්‍රී මහා බෝධිය මැරෙයි කියලයි. ඒක මිනිස්සුන්ගෙ හිතට වදිනවා. හැබැයි යථාර්ථය වෙනස් බව දැන් පැහැදිලියිනෙ.

**පාඩු පිට පාඩු ලබන රාජ්‍ය සේවා හෝ ව්‍යවසාය රටට බරක් වන මට්ටමට පැමිණ තිබෙනවා. ලංවිමට අදාළව මේ චෝදනාව ගැන ඔබ දෙන උත්තරය මොකද්ද?**

හොරකම් හා අකාර්යක්ෂමභාවය නිසා මේකෙ පාඩු වෙන බව බොහෝ අය කියනවා. මේකෙ හොරු නෑ කියලා මම කියන්නේ නෑ. මොකද සමස්තයක් වශයෙන් හොරකමට හුරු වූ රටක විදුලිබල මණ්ඩලයේ පමණක් වෙනස් තත්ත්වයක් දකින්න බෑනෙ. හැබැයි ඇත්ත කතාව ගත්තොත් සමහර අවුරුදුවල අපේ වියදම්වලින් 90% ක් විතර යන්නේ ඉන්ධනවලට. එතකොට අපේ ආයතන ලාභ ලබන්න නම් දිගුකාලීන සැලසුමක් හැටියට අවම කරගතයුත්තේ ඉන්ධන සඳහා දරන පිරිවැයයි. ආණ්ඩු මාරුවෙද්දී ඒ ඒ මොහොතට අදාළව තීන්දු ගැනීම නිසයි එහි වෙනසක් කරගත නොහැකිව තිබෙන්නේ.

**පාඩු ලබන තැන් හරිගස්සන්න රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්මක් ආණ්ඩුව දියත් කරමින් සිටිනවා. මේ ගැන ඔබේ අදහස කෙබඳු ද?**

ආසියාවේ මෑතකාලීනව දියුණු වූ හැම රටක්ම දියුණු වුණේ දේශපාලකයන්ගේ අවංකභාවය මත මිසක් ප්‍රතිව්‍යුහගතකරණයක් නිසා නෙවෙයි. හොඳම උදාහරණය තමයි ලංවිම ප්‍රතිව්‍යුහගතකරණය කියලා හදපු මහජන උපයෝගිතා කොමිසම. දැන් ඇමැතිවරු දෙන්නත් අසරණයි. මිල තීරණය කරන්නවත් බලාගාර හදන්නවත් තීන්දු ගැනීමේදී ඔවුන්ට බලයක් නෑ.

**මහජන උපයෝගිතා කොමිසම ස්වාධීන නම් තීන්දුවල ප්‍රශ්නයක් වෙන්නෙ කොහොමද?**

ඒක ස්වාධීනයි කිව්වට ඔවුන් මිල තීරණය කරන්නේ රජයේ බලපෑම උඩයි. අපේ ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන් 80% ක්ම පාවිච්චි කරන්නේ ඒකක 90ට වඩා අඩුවෙන්. විදුලි ඒකකයකට රුපියල් 15ක් වැනි මුදලක් වැය වුණත් අපි මේ පාරිභෝගිකයන්ට මුල් ඒකක 90ට අය කරන්නේ ඉතාම අඩු මුදලක්. මේක රජයෙන් දෙන ලොකු සහනයක්. මේ ආයතනය පාඩු නොලබා තිබෙන්න නම් ඒ සහනය අපට භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුයි. මහජන උපයෝගිතා කොමිසම මැතිවරණ දේශපාලනයට අදාළව ආණ්ඩුව පැත්තෙන් හිතලා මිල ගණන් අඩු කළාට මේ යථාර්ථයට උත්තරයක් දෙන්නේ නෑ. ඊටපස්සෙ වෙන්නෙ ටිකක් සල්ලිය බාගෙ තියෙන අයගෙන් රුපියල් 30, 40 ගානෙ කඩාගන්නවා. ඒකත් අසාධාරණයක්. විදුලිය සඳහා ලෝකෙ තිබෙන අවම අයකිරීම් වගේම වැඩිම අයකිරීම් තිබෙන්නෙත් අපේ රටෙයි. මේ කොමිසමෙත් අවංක නිලධාරීන් නෑ.

**ඔබ කියන ආකාරයට කොමිසම සැරසිල්ලක් පමණයි. එතකොට ලංකා විදුලිබල මණ්ඩලය නියාමනයට ආයතනයක් තිබීම නරකද?**

නැහැ. නියාමනය නරක නෑ. මේක අපේ පුද්ගලික දේපළක් නෙවෙයි. හැබැයි ඔවුන්ගේ තීරණ අවංක නෑ. පෞද්ගලික හුළං මුදලාලිට රුපියල් 23ක් ඒකකයකට ගෙවන්න තීරණය කරන්නෙත් මේ කොමිසමම තමයි. සූර්ය බලශක්තියට 18.50ක් කියලා අපි යෝජනා කළාම කොමිසම පෞද්ගලික අංශයට 28 ක් ගෙවන්න ඕනෑ කියනවා. ඒ මුදල අයකෙරෙන්නේ කාගෙන්ද? පොදු ජනතාවගෙන්. අපි මේ දේ වෙනුවෙන් අරගල කළාම ඒකාධිකාරයක් තියාගන්න හදනවා කියලා කිසිම පදනමක් නැති චෝදනා කරනවා. මිනිස්සුන්ටත් එවැනි දේ ඇහුණාම සාධාරණ කේන්තියක් එනවනෙ. හැබැයි පොදුජනයා වෙනුවට මුදලාලිලා ගැන හිතන්නේ කොමිසමයි. ඇත්තටම මහජන උපයෝගිතා කොමිසම කියන්නේ බුදු සරණයි බෝඩ් එක ගහගෙන ඇතුළේ හොර හරක් පටවන් යන ලොරියක්.

■ සංවාදය:- බිඟුන් මේනක ගමගේ

---

# සූරියවැව චණ්ඩි අලියා අල්ලන්න පැය හතක මෙහෙයුමක්

**සූරියවැව හා ඒ අවට ගම්මානවල ජනතාව භීතියට පත් කළ වන අලියා ඊයේ (12) සිදුකළ පැය හතක පමණ මෙහෙයුමෙන් පසු අල්ලා ගැනීමට සමත් වූ බව වනජීවී නිලධාරීහු පවසති.**

පසුගිය දින කිහිපය පුරාම සූරියවැව වැලිවැව, 14 කණුව, මීගහජඳුර, කරමැටිය ඇතුළු අවට ගම්මාන වල සැරිසරමින් පාරේ ගමන් කරන පිරිස් පසුපස එළවමින් ඉතා කලහකාරී ලෙස හැසිරුණු වන අලියකු පිළිබඳව පසුගිය දින කිහිපය පුරාවටම වාර්තා විය. මෙම අලියා පිළිබඳව හා අලි කරදර පිළිබඳවත් ගම්මුන් පිරිසක් සූරියවැව ප්‍රාදේශීය ලේකම්වරයාටද මීට දින කිහිපයකට පෙර දැන්වීමට කටයුතු කළ බවයි ජනතාව පැවසුවේ. එහිදී ජනතාව ජීවිතයක් නැතිවීමට පෙර කිසියම් විසඳුමක් ලබාදෙන ලෙසටද ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලූ බවත් ඔවුන් වැඩිදුරටත් පැවසීය.

**කෙසේ වෙතත් ප්‍රදේශයේ වගකිවයුතු නිලධාරීන් ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමට සවන් නොදීමේ ප්‍රතිපලයක් ලෙස තවත් එක් මිනිස් ජීවිතයක් වන අලින්ට ගොදුරු වූ බවයි ජනතාව චෝදනා කරන්නේ.**

පෙරේදා (11) සූරියවැව මීගහජඳුර ප්‍රදේශයේ 42 හැවිරිදි කාන්තාවක වන අලි ප්‍රහාරයට ලක්ව මියගොස් තිබේ. වන අලි ප්‍රහාරයෙන් මියගියේ එස්.ඒ. චන්ද්‍රානි නැමති එක් දරු මවකි. ඇය පෙරේදා උදේ 6.45ට පමණ මිදුල අතුගාමින් සිටියදී මෙම වන අලි ප්‍රහාරයට ලක්ව තිබේ.

වන අලි ප්‍රහාරයෙන් කාන්තාව මියයාමත් සමඟ ගම්වාසීන්ද කුපිත වී ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන්ටද චෝදනා එල්ල කළේ මිනිස් ජීවිතයක් අහිමිවන තෙක් කිසිවකුත් වන අලි කරදර පිළිබඳව සොයා නොබැලූ බවටයි.

**වන අලි ප්‍රහාරයන් සමඟ වන අලියා ඇල්ලීමේ මෙහෙයුම ඊයේ (12) හම්බන්තොට, ලුණුගම්වෙහෙර හා උඩවලව වනජීවී කාර්යාලවල නිලධාරීන්ගෙන් සැදුම්ලත් විශේෂ කණ්ඩායමක් විසින් පැය 07ක පමණ මෙහෙයුමක් සිදුකර සූරියවැව රාජපක්ෂ ක්‍රීඩාංගණය අසල කැලෑ කොටසේදී වන අලියා නිර්වින්දනය කර අල්ලා ගැනීමට වන ජීවී නිලධාරීහු සමත් වූහ. මෙම මෙහෙයුම වනජීවී පශු වෛද්‍ය ධර්මකීර්ති මහතාගේ මූලිකත්වයෙන් සිදු කෙරුණු අතර අල්ලාගත් වන අලියා වයස අවුරුදු 30ක පමණ පිරිමි සතෙකි. වන අලියා අනුරාධපුර හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට රැගෙන යාමට නියමිත බවයි වනජීවී වනජීවී පශු වෛද්‍ය ධර්මකීර්ති මහතා පැවසුවේ.**

■ සූරියවැව නුවන් ජයසේකර